www.kidworship.kr

# යාකොබ් 2

– 10th Story–



66Page

**පොතේ ගුරා** තමාගේ ආශිර්වාදය සහ කුලුඳුල්කම යන දෙකම යාකොබ් විසින් ගත්ත නිසාඝ යාකොබ්ට නිවසින් පැනලා යාම හැර වෙන කිසිම විකල්පයක් තිබුණේ නෑ. ඒ නිසා යාකොබ්ඝ නිවසින් පැනලා ගිහින් තමාගේ මාමාගේ ගෙදර හිටියා. තමන් කරපු වරද ගැන දිනපතාම යාකොබ්ගේ හදවත දොස් කීවා.

---



67Page

**පොතේ ගුරා** යාකොබ් හාරාන් වගට යන පාරේ ඉර බැස්ස බැවින් එක රැයක් නතර වුණා. එතැන තිබුණු ගලක් රැගෙන තමාගේ හිසට තබාගෙන ඔහු නිදා ගත්තා. ඒ නිදා ගත්තාම ඔහු දකිනවාඝ හීනයක්. පොළොවේ තබන ලද ඉණිමගක් විය. එහි මුදුන අහස දක්වා විය. දෙවියන්වහන්සේගේ දූතයෙක් එහි නැගිටිමින් දඝ බසිමින් ද සිටියේ ය. ඊසාක්ට කතා කරපු දෙවියන්වහන්සේ ඊට ඉහළින් සිට කතා කරනු දකිනවා.

**දෙවියන්වහන්සේ** යාකොබ්ඝ මට ස්වාමින් වන දෙවියන්වහන්සේ නුඹ නිදා සිටින දේශයඝ නුඹට ද නුඹේ වංශයට ද දෙන්නෙමි. ඔබේ වංශය මේ පොළොවේ තිබෙන දූවිලි වලට වඩා වැඩිවෙන්න යනවා. මම නුඹ සමග සිටින්නෙමි. නුඹ කොතැන ගියත් මම නුඹ සමග වන්නෙ'ය.

---



68Page

**පොතේ ගුරා** යාකොබ් හීනෙන් පිබිද නැගිටඝ පුදුමයට පත් වුණා.

**යාකොබ්** දෙවියන්වහන්සේට ස්තුති වේවා !

**පොතේ ගුරා** යාකොබ් තමා නිදා සිටි ගල රැගෙන පූජාසනයක් සාදා තෙල් වත්කොටඝ එය බෙතෙල් කියා නම් කළා.
යාකොබ් දෙවියන්වහන්සේට ස්තුති කළා.

---



69Page

**පොතේ ගුරා** යාකොබ් ඔහුගේ මාමාගේ නිවසට ආවා. එහි මාමාගේ දුව රාබෙල්ව දකිනවා. ඇය දකනින වෙලාවේ පටන් යාකොබ් ඇයට කැමති වෙනවා.

**යාකොබ්** මාමේ ඔබේ බාල දියණිය වන රාබෙල්ව මට දෙන්න කැමතිනම් මම ඔබට ඒ වෙනුවෙන් අවුරුදු 7 ක් වැඩ කරන්න බැඳී සිටිනවා.

**පොතේ ගුරා** අවුරුදු 7 ක් ගෙවිලා ගියා. යාකොබ් රාබෙල්ට කෙතරම් ආදරේ කළා ද කිව්වොත් මේ වසර 7 යනවා ඔහුට දැණුනෙවීත් නෑ.

---



70Page

**පොතේ ගුරා** යාකොබ් තමන්ගේ මාමා වූ ලාබන්ට කතා කළා.

**යාකොබ්** මාමේ... දැන් අවුරුදු 7 ක් ගෙවිලා ගියා. දැන් මට රාබෙල් මගේ භාර්යාව වශයෙන් ලබා දෙන්න.

**පොතේ ගුරා** යාකොබ්ගේ මාමා වූ ලාබන්, බාල දියණිය වෙනුවට,
ඔහුගේ වැඩිමහල් දුවව යාකොබ්ට විවාහ කර දෙන්න තීරණය කළා.
ලාබන්ගේ මනසේ තිබුණේ බාල දුවට කලින් වැඩිමහල් දුව විවාහ විය යුතුයි යන අදහස යි.



71Page



72Page

**ලාබන්** යාකොබ් ඔයා තව අවුරුදු 7 ක් වැඩ කරන්න ඕන.
එතකොට මම ඔයාට රාබෙල්වත් විවාහ කරලා දෙන්නම්.

**පොතේ ගුරා** යාකොබ් ඒ අවුරුදු 7 ත් වැඩ කරන්න තීරණය කළා.
ඒ අවුරුදු 7 නුත් පසුව ඔහු ගොඩාක් ආදරය කරපු රාබෙල් ඔහුට විවාහ කර ගන්න පුලුවන් වුණා.

.................................................................................................

**පොතේ ගුරා** මෙසේ යාකොබ් ලෙයා සහ රාබෙල් යන දෙදෙනාම විවාහ කර ගත්තාට පසුව ඔවුන්ට බොහෝ පුතුන් ලැබුණා. ඔවුන් තමාගේ මාමාට අයිති සියලු දේපළ බලා ගනිමින් එහිම වැඩ කරගෙන ජීවත් වුණා.
දේව ආශිර්වාදය යාකොබ්ට තිබුණු නිසා යාකොබ් සඵලවත් වී ධනවත් වුණා.

.................................................................................................

**ජිවිතයට අදාල කිරීම** දුවේ පුතේ, අපි කෙනක්ව රැවැට්ටුවොත් අපිත් අනිවාර්යෙන්ම රැවටෙනවා. දෙවියන්වහන්සේ රැවටිලිකාරකමට කැමති නෑ.
ඔබේ දෙමව්පියන් වැඩිහිටියන් හෝ කවුරුන් හෝ ඔයා රැවැට්ටුවාද?
එහෙනම් අදම දෙවියන්වහන්සේගෙන් සමාව ගන්න.